**THE EMBASSY OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**
**TO BELGIUM, LUXEMBOURG AND THE EUROPEAN UNION**
**27, RUE JULES LEJEUNE, 1050 BRUSSELS, BELGIUM**

TEL: (0032.2) 344 53 94. (0032.2) 344 55 85 FAX: (0032.2) 344 67 37 E-MAIL: secretariat@srilankaembassy.be

# 2600 සම්බුද්ධත්ව ජයන්තිය සමරා බෙල්ජියමේ 'මහ පිරිත' සජ්ඣායනා කෙරේ

2600 සම්බුද්ධත්ව ජයන්තිය සැමරීමවස් බෙල්ජියමේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයය 2011 මැයි 22 වැනි දින ශ්‍රී ලංකා තානාපති නිවසේදී 'මහ පිරිත්' සජ්ඣායනයක් සංවිධානය කළහ. මෙම අවස්ථාව සඳහා ආසියානු රටවල තානාපතිවරු සහ තානාපති නිලධාරීන්, බෙල්ජියමේ බෞද්ධ සංවිධානයන්හි නියෝජිතයන් සහ බෙල්ජියමේ සහ ලක්සම්බර්ගයේ පදිංචිව සිටින ශ්‍රී ලාංකිකයන් සියයකට අධික පිරිසක් සහභාගීවූහ.

මෙම ආගමික කටයුත්ත ආරම්භ කරමින් සිංහල හා ප්‍රංශ භාෂාවන්ගෙන් පිරිස ඇමතූ ප්‍රංශයේ අධිකරණ සංඝනායක සහ පැරිසියේ ජේතවන විහාරාධිපති පූජ්‍ය මුරුන්ගස්යායේ ඥානිස්සර හිමියෝ ලොවපුරා වෙසෙන බෞද්ධයින්ට මෙම වෙසක් තෙමගුල වැදගත්වීමට හේතු පැහැදිලි කළහ. එසේම සෑම බෞද්ධයෙකු විසින්ම පිළිපැදිය යුතු බෞද්ධ වත්පිළිවෙත් සම්බන්ධයෙන් කරුණු පැහැදිළි කළ උන්වහන්සේ මහ පිරිත් සජ්ඣායනයේ අනුහස් සම්බන්ධයෙන්ද පිරිස දැනුවත් කළහ.

බ්‍රසල්ස්හි වෝටර්ලූ වට් තායි ධර්මාරාමයේ අධිපති පූජ්‍ය. ප්‍රා සුධිනනවිදෙස් ඉංග්‍රීසි බසින් අනුශාසනයක් කරමින් බුදුහිමියන්ගේ ඉගැන්වීම් නූතන සමාජයට වඩවඩාත් ගැපෙන බවත් මෙම කරුණ බෙල්ජියමේ සහ යුරෝපය පුරා බුදුදහම ව්‍යාප්ත වන ආකාරයෙන් මොනවට පැහැදිළිවන බවද වදාළහ. මෙම උතුම් දිනය සැමරීමට බෙල්ජියම පුරා විසිරී සිටින බෞද්ධයන් එක්රැස් කිරීමට මූලිකත්වයක් ගෙන කටයුතු කිරීම සම්බන්ධයෙන් එතුමා ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට සිය ප්‍රශංසාව පළකළහ.

මෙම අවස්ථාවට සහභාගීවූ යුරෝපීය බෞද්ධ සංගමයේ සභාපති ෆ්‍රාන්ස් ගොටෙන්බර් මහතා සිය සංගමය පසුගිය සතළිස් වසරක කාලයක් මුළුල්ලේ බෞද්ධ ධර්මය යුරෝපයේ ප්‍රචලිත කිරීමට ගන්නා උත්සාහය සම්බන්ධයෙන් කරුණු දැක්වූ අතරම ශ්‍රී ලාංකීය බෞද්ධයින් සමගින් කටයුතු කිරීමට ලැබීම සිය භාග්‍යයක් කොට සළකන බවද පැවසීය. 'ආසියාවෙන්, විශේෂයෙන් ශ්‍රී ලංකාවෙන් අපට ලැබුණු බෞද්ධ දර්ශනය අපි ඉතාමත් උතුම් කොට සළකනවා වගේම ඒ සම්බන්ධයෙන් අප ආසියාවට ණය ගැතිවෙනවා. එය අපේ ජීවිතයේ මගපෙන්වන පහන්සිළ බවටද බුද්ධාගම පත්වී තිබෙනවා' යනුවෙන් හෙතෙම පැවසීය.

බෙල්ජියමේ, ලක්සම්බර්ගයේ සහ යුරෝපා සංගමයේ ශ්‍රී ලංකා තානාපති රවිනාථ ආර්‍යසිංහ මහතා රැස්ව සිටි පිරිස අමතමින්, මෙම උත්සවය සංවිධානය කිරීම සඳහා බෙල්ජියමේ පදිංචිව සිටින බෞද්ධ සහ බෞද්ධ නොවන ශ්‍රී ලාංකිකයන් සියලුදෙනා එකලෙස දයකවූ බවත් මෙම පුණ්‍යෝත්සවය පැවැත්වීම හරහා මෙහි රැස්ව සිටින දූදරුවන්ට මෙවන් ආගමික කටයුතු හා බැඳී පවත්නා වත්පිළිවෙත් මෙන්ම මෙවන් ආගමික උත්සවයන් සමරන්නාවූ ආකාරය පිළිබඳ දැනුමක්ද ලබාදීම අරමුණක්වූ බවත් පැවසීය. එසේම සම්බුද්ධත්ව ජයන්තිය පසුගිය සති කිහිපයක පුරා ලොවපුරා පැවැත්වීමෙන් එය වර්තමානයේදී ගෝලීය මට්ටමෙන් සැමරෙන උත්සවයක් බවට පත්ව ඇති බවද

හෙතෙම පෙන්වාදුන්නේය. විදේශ රාජ්‍යයන්ගේ වෙසෙන බෞද්ධ භික්ෂූන් සිය ධර්මදූත සේවය හරහා සිදුකරන්නාවූ අතිමහත් සමාජ-සංස්කෘතික මෙහෙවර සම්බන්ධයෙන්ද ආර්‍යසිංහ මහතා ඔවුනට සිය ගෞරවය පළ කළ සිටියේය.

ප්‍රංශය, ජර්මනිය හා ශ්‍රී ලංකාවේ සිට පූජ්‍ය කො.ආනන්ද, පූජ්‍ය මුරුන්ගස්යායේ ඥාන්ස්සර,පූජ්‍ය රත්මලේ පුඤ්ඤදරතන, රත්මලේ සෝමරතන සහ සීගිරියේ රත්නපාල හිමිවරු මෙම මහපිරිත සජ්ක්ධායනය සඳහා වැඩමකළහ.

බෙල්ජියමේ වෙසෙන ශ්‍රී ලාංකික දූදරුවන් විසින් නිමැවූ දර්ශණීය වෙසක් කූඩු වලින් ශ්‍රී ලංකා තානාපති නිවස අලංකාරවත් කර තිබුණි.

එසේම මහා සංඝරත්නය උදෙසා දිවා දනයමය පින්කමක් 2011 මැයි 23 වන දින ශ්‍රී ලංකා තානාපති කාර්යාල පරිශ්‍රයේදී පැවැත්විණි.

ශ්‍රී ලංකා තානාපති කාර්යාලයය
බ්‍රසල්ස්

2011 මැයි 25